ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1984 අංක 43 දරන ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 නොවැම්බර් මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 නොවැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි　　තැපැල් ගාස්තුව : ශත 60 යි.

## 1984 අංක 43 දරන ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 නොවැම්බර් මස 05 වන දින.]

එල්. ඩී.—ඕ. 13/84.

**ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජික යන් එකඟ වන රීති අනුව එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා එක්දහස් නවසිය හැටපහ වර්ෂයේ සිට මෙතෙක් කල් බත්තර මුල්ලේ පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුයේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු මෙතෙක් කල් එකී සමිතිය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් ද එම සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1984 අංක 43 දරන ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භවීමේ දින සිට හා ඉන්පසු (මෙහි මින්මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින හා සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් ද "ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි වන්නේ ය. ජයන්තිපුර එක්සත් බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) බෞද්ධ ප්‍රතිපත්ති පිළිපැදීමට පහසුකම් සැලසීම ;

(ආ) බුද්ධ ධර්මය අධ්‍යයනය කිරීමට සහ පතුරුවා හැරීමට ධෛර්ය දීම සහ පහසුකම් සැලැස්වීම ;

(ඇ) බෞද්ධයන්ගේ අධ්‍යාත්මික හා සංස්කෘතික අභිවෘද්ධිය ප්‍රවර්ධනය කිරීම ;

(ඈ) බෞද්ධයන් අතර සමගිය හා සහයෝගය වර්ධනය කිරීම ;

ජ 075167—6,225 (84/02)

(ඉ) පක්ෂ දේශපාලනය හා සම්බන්ධ නොවූ සමාජයීය කටයුතු වලට සහයෝගය දැක්වීම ;

(ඊ) පොදු සමාජ සේවාවන්හි යෙදීම සහ එම කටයුතුවලට ආධාර දීම ; සහ

(උ) බුද්ධ ධර්මයෙහි අභිවෘද්ධිය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටවල අර්ථදායකයින්ගෙන් ප්‍රදානයන් හා පරිත්‍යාගයන් ලබා ගැනීමේ හෝ එකතු කිරීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවකයන් සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ වැඩි දියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ වුවද සියලු ක්‍රියා කිරීමේත් සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේත් බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට යටත්ව, කළමනාකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ ධුර දරන සංගමයේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය සමන්විත විය යුතුය.

සංස්ථාවේ රීති.

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහාත්, කළමනාකාර මණ්ඩලයේ හා සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටුකිරීම සඳහාත්, සංස්ථාවේ කටයුතු කර ගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහාත්, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහාත්, සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී හා වැඩි ඡන්දයෙන් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී එකී ආකාරයෙන්ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම (2) වන උපවගන්තියේ නියමයන්ට යටත්ව කළ හැකි වන්නේ ය.

(2) සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා කිසිදු රීතියක් හෝ මින්මතු (1) වන උපවගන්තිය යටතේ සම්මත කරගනු ලබන කිසිදු රීතියක් සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන් විනා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙහි බලපවත්නා සංගමයේ රීති මේ වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත්කාලයෙහි බලපවත් වන සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු ණය හා සංගමයට අයවිය යුතු ණය.

7. මෙම පනතේ කාර්යයන් සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි දී පවත්නා සංගමයේ සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සංගමයට අයවිය යුතු සියලු ණය හා සංගමයට ගෙවිය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

8. කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතුය. එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව—

(අ) යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තුවකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව සතු වන්නාවූ චංචල හෝ නිශ්චල කවර දේපළක් වුවද භාර ගෙන තබා ගැනීමට සහ ඒ සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා දැරීමට ; සහ

(ආ) එම දේපළ විකිණීමට, උකස් කිරීමට, බද්දට දීමට, හුවමාරු කර ගැනීමට හෝ අන් ආකාරයකින් බැහැර කිරීමට ද

නීතිය අනුව සංස්ථාවට හැකි විය සහ සුදුසු විය යුතු ය.

ණය ගැනීමේ බලතල.

10. සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කරගැනීම සඳහා සංස්ථාව විසින් මුදල් ලබාගැනීම සහ ඒ කාර්යය සඳහා යම් උකස්, බැඳුම් කර හෝ බැඳීම් සංස්ථාව විසින් ඇති කිරීම, ක්‍රියාවේ යෙදවීම, ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය:

එසේ වුවද, සංස්ථාව විසින් එසේ ලබාගත හැකි මුදල්වල එකතුව, කළමනාකාර මණ්ඩලය විසින් එම කාර්යය සඳහා නිශ්චය කරනු ලබන මුදල නොඉක්මවිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන් ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන් සහ ඔවුන් මඟින්, ඔවුන් ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන් ගේ හෝ අයිතිවාසිකම් වලට මේ පනතෙහි අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 යි. (විදේශීය) රු. 200 යි. කොළඹ 1, තැ. පෙ., අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නම් වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.